# වනමලී සහ තාරකා



පිතුම් ධනාරා පතිනායක

# වනමලි සහ තාරකා

## ජිතුමි ධනාරා පතිනායක

කතෘ

## කතෘගේ වෙනත් කෘති

හා පැංචා ගමන ගියපු හැටි - 2023

| | | | |
|---|---|---|---|
| අඹ යහළුවෝ | -2024 | එකමුතුකමේ අගය | -2024 |
| හඳ ගමන | -2024 | සිතුමියි දිනිතියි | -2024 |
| වලස් අම්මාගේ අමුතු කෑම | -2024 | සඳිනි | -2024 |
| පොහොය දොලහේ වැදගත්කම | -2024 | පුංචි අපේ මුතු | -2024 |
| TIMMY AND THE BALL | -2024 | අය්යයි මමයි අක්කයි | - 2024 |
| THE LITTLE FOX AND THE MOON | -2024 | JIMMY | -2024 |



පාසැල: මහාමායා බාලිකා විද්‍යාලය
පංතිය: 5 ශ්‍රේණිය - B
කෘතිය පලකරන දිනය: 2026.05.10 දින

ISBN 978-624-208-935-5

# පිදුම

මෙම පොත ලිවිමට මා දිරිමත් කළ

මහනුවර මහාමායා බාලිකා විදුහලේ ගුරු භවතුන් වන

සෙනෙවිරත්න මහලේකම් ගුරු පියානන්

සහ

පංති භාර ගුරු තුමා හේමන්ත තිලකරත්න ගුරු පියානන්ටත්,

නිරන්තරයෙන්  මා හට උදව් කළ මාගේ මෑණියන්, පියානන්,අයියා
සහ අක්කා හට

ඉතා ආදරයෙන් මෙම පොත පුදමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා  සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමගින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමී.

ප්‍රදීප් නිලංග දැල,<br>
දියවඩන නිලමේ,<br>
ශ්‍රී දළදා මාලිගාව<br>
2026.05.10

වනමලි සහ තාරකා

හොඳම යාළුවෝය.

එයාලාගේ ගෙවල් දෙකම තිබුණේ එකම ගමේය.

එකම පාසලේ, එකම පන්තියේ,

තමයි මේ යාළුවෝ දෙන්නා ඉගෙන ගත්තෙ.



තාරකාලගේ ගෙදර අය හරිම පොහොසත්. ඔවුන්ට ලස්සන විශාල ගෙදරක් තිබුණා.

ඇයට මල්ලිලා දෙන්නෙක් හිටියා. ඔවුන් දෙදෙනා හරිම දඟයි.

ඔවුන්ට බයිසිකල් දෙකක් තිබුණා.

මේ දෙන්නා නිතරම බයිසිකල් පදිනවා.

පාසල් යන්නෙත් බයිසිකලෙන්.



වනමලී හරිම දුප්පත් ළමයෙක්.

ඇයගේ දෙමාපියෝ ජීවත් වුනේ එළවලු වගා කරලා.

ඇයට අක්කා සහ මල්ලි කෙනෙක් තමයි හිටියෙ.

මෙයාල හැමෝම එළවලු වගාවට උදවු කරනවා.



වනමලිලගෙ ගෙවත්ත හරිම ලස්සනයි.

එය එළවලු, පලතුරු වලින් පිරිලා තිබුණා.

පොඩි ගෙදරක් වුණාට ඒක හරිම ලස්සනයි.



තාරකාගේ ගෙදර අය සතියකට වතාවක් වනමලිලගෙ ගෙවත්තට යනවා.

තාරකාගේ අම්මා වනමලිලගෙ ගෙදරින් හොඳ එළවළු, පලතුරු මල්ලක් අරගෙන තමයි එන්නෙ.



වනමලිලගෙ ගෙදර තිබුණේ

ලස්සන කන්දක් පාමුලයි.

ඒ කන්දෙන් ගලා එන වතුර තමයි එයාල

ප්‍රයෝජනයට ගත්තෙ.



එදා තද වැසි දිනයක්,

ඒ වැස්ස එකදිගට දින කිහිපයක් තිබුණා.

කන්ද ටික ටික වතුරට දියවී පහලට එන්න ගත්තා.

කන්ද පාමුල සිටි පවුල් හැමෝම ගමේ පන්සලට ගොස් නැවතුණා.

වනමලිලගෙ ගෙදර අයත් පන්සලේ නතරවුනා.



තාරකාගේ අම්මත් තාත්තත් පන්සලට ගොස් තාරකාගේ ගෙදරට වනමලිලාව එක්ක ආවා.

යහළුවෝ හැමෝම හොඳටම සෙල්ලම් කරලා සතුටු වුණා.

වනමලිලගෙ අම්මා හොඳටම ඇඩුවා. ඒක දැකපු තාරකාගෙ ගෙදර අයට ගොඩාක් දුක හිතුණා.



පසු දින තාරකාගේ තාත්තා සමග

වනමලිගේ තාත්තා

එයාලගේ ගෙදර බලන්න ගියා. හැමෝම ඔවුන්
ආපසු එනතුරු මගබලා සිටියා.



වනමලිලගෙ තාත්තා ගෙදර ආවේ හරිම දුකෙන්. එයාලගේ පොඩි පැල්පත අර මහා විශාල යෝධ පස් කන්දට යටවෙලා.



ඒ මොරසුරන වැස්ස ටිකටික අඩු වුණා.

ගමේ තිබුණු කුඹුරු යායවල්, වගාබිම් ගංවතුරට යටවෙලා.

ගමේ හැමෝම එකතු වෙලා විපතට පත් අයට උදව් කළා.



තාරකාගේ තාත්තා ඉතා ඉක්මනින්ම තාරකාගේ නිවස ළඟම අළුත් නිවසක් හැදුවා.

නිවසට අවශ්‍ය බඩුත් ගෙනවිත් තිබුණා.

පසුදා තාරකාගේ ගෙදර හැමෝම එකතු වෙලා වනමලිලට ඒ ගෙදර භාර දුන්නා.

එයාල හරිම සතුටින් නැවත ජීවිතය පටන් ගත්තා.



## පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල, නූතන තාක්ෂණික මෙවලම්, මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි, පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මුලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලමෙ තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුතිවන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN 978-624-208-935-5